# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1713/10 — 2011 ජූලි 05 වැනි අඟහරුවාදා - 2011.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 272(6) වැනි උපවගන්ති සමග කියවිය යුතු එකී පනතේ 267 වැනි වගන්තියෙන් කොළඹ මහ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, කොළඹ මහ නගර සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා පත් කරන්නට යෙදුණු ඔමර් සුරේක් කාමිල් මහතා විසින් 2009.12.28 වැනි දින තීරණ අංක 736 යටතේ අනුමත කර ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී, 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 268 වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා<br>
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,<br>
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,<br>
මිනිස්බල හා රැකී රක්ෂා සහ<br>
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2011 ජුනි මස 06 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**ප්‍රචාරක දැන්වීම්, සැරසිලි සහ පෝස්ටර්ස්**

01. මෙම අතුරු ව්‍යවස්ථා කොළඹ මහ නගර සභාවේ ප්‍රචාරක දැන්වීම්, සැරසිලි සහ පෝස්ටර්ස් අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ප්‍රචාරක දැන්වීම්**

02. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමට පෙර දින හෝ පසු දින කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ආරම්භ වී ඇති විටෙක, එම ප්‍රචාරක දැන්වීම, මෙම ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාවල සඳහන්කර ඇති කොන්දේසි හා අවශ්‍යතාවයන්ට යටත් වේ.

1A - PG 001264— 340 (2011/07)

03. කිසියම් විථියකට, මාර්ගයකට, වැවකට, මුහුදකට හෝ අහසට දිස්වෙන ආකාරයට කිසිදු ප්‍රචාරක දැන්වීමක් නාගරික කොමසාරිස් විසින් ඒ වෙනුවෙන් සකස් කරන ලද බලපත්‍රයක් මත ලද අවසරය යටතේ හැර කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම කිසිදු පුද්ගලයෙකු විසින් නොකළ යුතු ය.

කෙසේ වුව ද, පහත සඳහන් කිසියම් ප්‍රචාරක දැන්වීමක්, විදුලි ආලෝකයෙන් ආලෝක වූ එකක් නොවන්නේ නම්, මෙම අතුරු ව්‍යවස්ථාවල පූර්වයේ සඳහන් වූ විධිවිධාන එවැනි දැන්වීමට අදාළ නොවේ.

එවැනි ප්‍රචාරක දැන්වීම් නම්.–

(අ) අනුමත පුණ්‍යායතනයකට, ආබාධිත පුද්ගලයන්ගේ හෝ පාසල් ළමුන්ගේ ශුභසාධනය සඳහා ලැබෙන ශුද්ධ ආදායම යොදා ගන්නා වූ කිසියම් විනෝද උත්සවයකට අදාළ ප්‍රචාරක දැන්වීමක්,

(ආ) කිසියම් විනෝද උත්සවයකට අදාළ ප්‍රචාරක දැන්වීමක්, එනම්, විශේෂයෙන් එවැනි ප්‍රචාරක දැන්වීමක් අදාළ පරිශ්‍රය තුළම සවිකර ප්‍රදර්ශනය කිරීම,

(ඇ) කිසිදු වානිජ ප්‍රචාරක දැන්වීමකින් තොර වූ ආගමික, දේශපාලනික හෝ රාජ්‍ය කටයුත්තකට අදාළ ප්‍රචාරක දැන්වීමක්,

(ඈ) අදාළ ප්‍රචාරක දැන්වීම උපරිම වශයෙන් අඩි 4 x අඩි 3 ප්‍රමාණයට සීමා වූ කිසියම් දේපොළක් හෝ වාහනයක් මිලදී ගැනීම, බදුදීම හෝ කුලියට දීම සඳහා වන කාර්යයන් සඳහා වන "කුලියට දීමට" හෝ "විකිණීම සඳහා" යනුවෙන් සඳහන් ප්‍රචාරක දැන්වීමක්,

(ඉ) ගෘහාශ්‍රිත නාම තහඩුවක්,

(ඊ) අයිතිකරුගේ නම සහ ලිපිනය සඳහන්කර වාහනයක් මත සවිකර ඇති ප්‍රචාරක දැන්වීමක්,

(උ) යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ නාමය, ලිපිනය හා ස්වභාවය ප්‍රදර්ශනය කරමින් එම පරිශ්‍රයේම සවිකර ඇති ප්‍රචාරක දැන්වීමක්.

4. අවම වශයෙන් අදාළ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම ආරම්භ කිරීමට අදහස් කරන දිනට දින විසි එකක් (21) ඉකුත්වීමට ප්‍රථම අදාළ ඉල්ලුම්පත සම්බන්ධයෙන් ගන්නා ලද තීරණයන් අයදුම්කරුට දැනුම්දිය යුතු වේ.

කෙසේ වුවද රජයට සම්බන්ධ කාර්යයන්, ජනතා පණිවිඩ සහ එක් මසකට හෝ ඊට අඩු කාල සීමාවක් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා මෙම ඡේදයේ පූර්වයේ සඳහන් කාල සීමාවට ගැනෙන ආකාරයට ඉදිරිපත් කර නොමැති එවැනි ඕනෑම ඉල්ලුම්පතක් විශේෂ අවස්ථාවන්හි දී නාගරික කොමසාරිස් විසින් භාරගත හැකිය. බැනර්, කොඩි, කටවුට් හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සවිකර ඇති විශාල ප්‍රමාණයෙන් ලෑලි වැටවල් ආදිය කෙටිකාලීන ප්‍රචාරක දැන්වීම් ගණයට අයත් වේ.

5. ඉහත අතුරු ව්‍යවස්ථා 4 යටතේ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලුම්පතක්ම පහත සඳහන් අංගයන්ගෙන් සමන්විය විය යුතු ය.

(අ) සභාව විසින් සකස් කරනු ලබන නියමිත ආකෘතියේ ඉල්ලුම්පත ඉදිරිපත් කළ යුතු ය,

(ආ) කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකි සැලසුම් නිර්මාණ, පිරිවිතරයන් හා එවැනි වෙනත් තොරතුරු,

(ඇ) අදාළ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට යෝජිත සැකිල්ල පිහිටි ස්ථානයට සම්බන්ධ 1 : 1000ට නොඅඩු පරිමාණයන්ට අඳින ලද භූමි සැලැස්මක්,

(ඈ) මෙම අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූල වන ආකාරයට එවැනි සැලැස්මක නිර්මාණයක හෝ පිරිවිතරයන්හි කිසියම් සංශෝධනයක් වේ නම්, එම සංශෝධන,

(ඉ) යාබද වීථිවලට හා පැහැදිලිව දෘෂ්ටියට හසුවන ඉඩම් සලකුණුවලට අදාළ ප්‍රචාරක දැන්වීම් පිහිටි ස්ථානය දක්වමින් අඳින ලද සැලැස්මක්,

(ඊ) අයදුම්කරු ප්‍රදර්ශනය කිරීමට අදහස් කෙරෙන ප්‍රචාරව දැන්වීම් පිහිටි පරිශ්‍රයේ හිමිකරු නොවන්නේ නම්, අදාළ පරිශ්‍රයේ නීත්‍යානුකූල හිමිකරු විසින් අත්සන් කරන ලද නාගරික කොමසාරිස් වෙත යොමු කරන ලද එකඟතාවය පළ කිරීමේ ලිපියක්,

(උ) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරිම සඳහා අනුමැතිය ලබාදීම සඳහා කලින් කල නාගරික කොමසාරිස් විසින් නියම කළ හැකි එවැනි වෙනත් තොරතුරු.

06. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නාගරික කොමසාරිස් විසින් බලපත්‍රයක් ලබාදී නොමැති, ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ කාර්ය සඳහා කිසියම් ව්‍යුහය සහ/හෝ දැන්වීම් පුවරු වැටක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැළැස්වීම, කිසිදු පුද්ගලයෙකු විසින් කොළඹ මහ නගර සභා සීමාව තුළ සිදුනොකළ යුතු වේ.

07. ඉහත අතුරු ව්‍යවස්ථා 04 යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් නාගරික කොමසාරිස් විසින් අනුමත කරන විටදී නියම කර ඇති ගාස්තුව සභාවට ගෙවන තුරු ඉල්ලුම්කරුහට බලපත්‍රය නිකුත් නොකළ යුතු ය.

08. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් පුද්ගලයෙකුට බලපත්‍රයක් නිකුත් කරන විට දී, එම බලපත්‍රයේ යොමු අංකය සහ නාගරික කොමසාරිස්හට අවශ්‍යයැයි සැළකෙන එවැනි වෙනත් තොරතුරු එම ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකට ම ඇතුළත් කළ යුතු බවට එම පුද්ගලයා හට නාගරික කොමාසාරිස් විසින් උපදෙස් දිය යුතු වේ.

09. කොළඹ නගර සභාවට අයත් සහ/හෝ සභාව විසින් නඩත්තු කරනු ලබන මාර්ගවලට අයත් කිසිදු වෙන් කරන ලද බිම් පෙදෙසක (Reservation) අදාළ ව්‍යුහය ඇතුළුව ප්‍රචාරක දැන්වීමක් සහ හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ලෑලි වැටක් අඩි 20 (තිරස්) x අඩි 10 (සිරස්) ප්‍රමාණයෙන් බැහැරව සහ සමචතුරස්‍රාකාර හැඩයෙන් තොරව ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිදු පුද්ගලයෙකු විසින් නොකළ යුතු ය. මෙම ප්‍රචාරක දැන්වීම් ව්‍යුහය සහ/හෝ දැන්වීම් පුවරු ලෑලි වැට සඳහා බිම සූදානම් කිරීමේ ප්‍රමාණය මී. 2.5ක් විය යුතු අතර, ශුද්ධ කළයුතු ප්‍රමාණය මාර්ගයෙන් පදික වේදිකාව අයිනේ සිට මීටර් 1.5ක් එපිටට විය යුතු ය.

10. ගැසට් කර ඇති (නිශ්චිත) මාර්ග සංඥා, ඒවායේ කණු සහ මාර්ග සංඥා සිරසවල් (මුදුණ) කණු ආදිය මත කිසිදු පුද්ගලයෙකු විසින් කිසිදු ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

11. පොලව මට්ටමේ සිට අවම උස මී. 2.5ක් වශයෙන් පවත්වා ගැනීමෙන් තොරව කිසිදු පුද්ගලයෙකු විසින් කිසිදු ප්‍රචාරක දැන්වීමක් ඊට අයත් ව්‍යුහය සහ/හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන ලෑලිවලට ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු වේ.

12. ඓතිහාසික පසුබිමක් සහිත ගොඩනැගිලි, සංස්කෘතික වටිනාකමක් සහිත ගොඩනැගිලි හරිත වෘක්ෂලතාවලින් සමන්විත ප්‍රදේශ, ප්‍රසිද්ධ උයන්, ළමා ක්‍රීඩාපිටි, ස්මාරක, පිළිරු, ආගමික සිද්ධස්ථාන, සුසානභූමි, විදේශ දූත මණ්ඩල කාර්යාලයන්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගොඩනැගිලි ආදිය දර්ශන පථයට හසුවීමෙන් වැලකෙන ආකාරයට කිසිදු පුද්ගලයෙකු විසින් කිසියම් ප්‍රචාරක දැන්වීමක්, ඊට අදාළ ව්‍යුහය සහ හෝ ප්‍රචාරක ලෑලි වැට ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

13. දැකීමට අප්‍රසන්න විරෝධාකල්ප ඇතිවිය හැකි හෝ ඒ මගින් යම් සේවාවක් අපේක්ෂිත ප්‍රදේශයේ ජනතාවට හානිකර කිසිදු ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරිමට සැළැස්වීම කිසිදු පුද්ගලයෙකු විසින් නොකල යුතු ය.

14. නියොන් රසායනික ද්‍රව්‍යයන් අලෝකමත් වූ කිසියම් ප්‍රචාරක දැන්වීම් හෝ ආලෝකය නිවෙන හා පත්තුවෙන, දුවන ආකාරයට දිස්වෙන හෝ ක්ෂණිකව විශාල දීප්තියක් දී නැවත නිවී පත්තුවන කිසියම් ප්‍රචාරක දැන්වීමක් හෝ රියදුරන්ගේ දර්ශන පථය හානිකර ආකාරයට වෙනත් දිසාවකට යොමුවිය හැකි නිවෙන පත්තුවෙන, දුවන ආකාරයට දිස්වෙන හෝ ක්ෂණිකව විශාල දීප්තියක් දී නැවත නිවි නිවී පත්තුවන කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිදු පුද්ගලයෙකු විසින් නොකළ යුතු ය.

15. දේපළ හිමිකරුවන්ගේ අදාළ දේපළවල ඉදිරිපස කොටස, ඒවායේ වාතාශ්‍රය හා ස්වාභාවික ආලෝකය එම හිමිකරුවන් විසින් භුක්ති විඳීමේ අයිතිය අසාධාරණ අන්දමින් උල්ලංඝනය වන සේ ව්‍යුහය ද ඇතුළත්ව කිසිදු ප්‍රචාරක දැන්වීමක් සහ/හෝ ප්‍රචාරක දැන්වීම් සවිකරනු ලබන ලෑලි වැටක් හෝ කිසිවකු විසින් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

16. වෙනත් ප්‍රචාරක දැන්වීමක් මුදුනේ සිට බැලූවිට පෙනෙන ආකාරයට අදාළ ව්‍යුහය ද ඇතුළුව කිසිදු ප්‍රචාරක දැන්වීමක් සහ/හෝ ප්‍රචාරක දැන්වීම් සවිකරනු ලබන ලැලි වැටක් හෝ පොළව මත ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිවකුත් විසින් නොකළ යුතු ය.

17. සභාව විසින් හෝ රජය විසින් හෝ වෙනයම් බලයලත් ව්‍යවස්ථාපිත සංවිධානයක් විසින් තහනම්කර ඇති ස්ථානයක අදාළ ව්‍යුහය ද ඇතුළුව කිසිදු ප්‍රචාරක දැන්වීමක් සහ/හෝ ප්‍රචාරක දැන්වීම් සවිකරනු ලබන ලැලි වැටක් හෝ ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිවකුත් විසින් නොකළ යුතු ය.

18. නිදහස් මාවතේ හෝ ගාලු මුවදොර මධ්‍ය මාර්ගයේ වෙන්කර ඇති බිම් පෙදෙස තුළ හෝ ඒවාට මුහුණලා අදාළ ව්‍යුහය ද ඇතුළුව කිසිදු ප්‍රචාරක දැන්වීමක් සහ/හෝ ප්‍රචාරක දැන්වීම් කරනු ලබන ලැලි වැටක් හෝ ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිවකුත් විසින් නොකළ යුතු ය.

19. අදාල ව්‍යුහය ඇතුලුව කිසිදු ප්‍රචාරක දැන්වීමක් සහ/හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කෙරෙන ලැලි වැටක් මධ්‍යය දූපත්, වටරවුම්, රථ වාහන, දිශා ගත කරන දූපත්, විදුලි පහන් කණු, විදුලි සංදේශ කණු, ළමා ක්‍රීඩා පිටි, ඇතුළත් මහජන උද්‍යාන සහ පොදු මහජන සේවාවන් සපයන වෙනත් දේපළ ආදියෙහි ස්වභාවට අයත් සහ/හෝ සභාව විසින් පවත්වාගෙන යනු ලබන මාර්ගයන්හි ඒවාට වෙන් කරන ලද බිම් පෙදෙස්වල අනුග්‍රාහක වැඩ සටහනක් යටතේ එවැනි ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරන්නන් විසින් නඩත්තු නොකරන්නේ නම්, සහ එවැනි ප්‍රචාරක දැන්වීම්වල පිරිවිතරයන් නාගරික කොමසාරිස් විසින් අනුමත නොකරන්නේ නම්, කිසිදු පුද්ගලයෙකු විසින් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

20. මාර්ග හෝ රථවාහන සංඥාවලට සමාන වූ කිසියම් ප්‍රචාරක දැන්වීමක් කිසිදු පුද්ගලයන් විසින් ප්‍රචාරය කිරීම හෝ ප්‍රචාරය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

21. නාගරික කොමසාරිස් විසින් අනුමත නොකරන ලද ගොඩනැගිලිවල වහලයේ සවිකරන කිසිදු ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැළැස්වීම කිසිදු පුද්ගලයෙකු විසින් නොකළ යුතු ය.

22. මෙම අතුරු ව්‍යවස්ථාවන්වලට පටහැනිවූ කිසියම් දෙයක් වුව ද, ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් අනුග්‍රාහක වැඩසටහනක අන්තර්ගත හෝ එක් මසක් හෝ ඊට අඩු කාලසීමාවක් සඳහා වන කෙටිකාලීන ප්‍රචාරක දැන්වීම් වැඩසටහන්වල අන්තර්ගත ප්‍රචාරක දැන්වීම් ව්‍යාපෘතිය සඳහා පමණක් අදාළ කරගත හැකි සුදුසු පිරිවිතරයන් හඳුන්වාදිය හැකි බලය හා අධිකාරිය නාගරික කොමසාරිස් සතු වේ. බැනර් කොඩි, කටවුට් සහ/හෝ විශාල පුවරුවල ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් කෙටිකාලීන ප්‍රචාරක දැන්වීම්වලට ඇතුළත් ය.

23. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ මාර්ග වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රදේශය (Reservation) තුළ :-

(i) කිසියම් පුවරුවක් මත සවිකරන ලද ආධාරකයක හෝ රාමුවක ප්‍රදර්ශනය කරන ලද කිසියම් ප්‍රචාරක දැන්වීමක් ගෙනයාම හෝ කිසියම් වෙනත් පුද්ගලයෙකුට එසේ රැගෙනයාමට සැළැස්වීම ; හෝ

(ii) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ හා ඊට අදාළ නිවේදන කාර්යයන් සඳහා රැහැන් රහිත ග්‍රැමෆෝනය, තැටිවාදන යන්ත්‍රයක් සංගීත භාණ්ඩයක් හෝ වෙනත් උපකරණයක් යොදා ගැනීම ;

නාගරික කොමසාරිස් විසින් එවැනි ප්‍රචාරක දැන්වීමක් සඳහා අනුමැතිය ලබාදී නොමැති නම්, කිසිදු පුද්ගලයකු විසින් ඉහත සඳහන් ක්‍රියාවන් නොකළ යුතු වේ.

24. (1) කිසියම් ප්‍රචාරක දැන්වීමක් දසුනට අප්‍රසන්න හෝ පීඩාකාරී සහ මිනිස් සදාචාරාත්මක සීමාවනට පටහැනි දෙයක් නිරූපණය කරන විට, එවන් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සලස්වන පුද්ගලයා වෙන නාගරික කොමසාරිස් විසින් ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමෙන් නියම කර ඇති කාලසීමාව තුළ එවන් ආකාරයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම නවත්වන ලෙසට නියෝග කළ හැකිය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ අනු ඡේද යටතේ (1) යටතේ නිවේදනයක් කිසියම් පුද්ගලයෙකු වෙත නිකුත් කර ඇති විට දී එම නිවේදනයේ නියම කර ඇති කාල සීමාව තුළ දී, එම පුද්ගලයා එම නිවේදනයට අනුකූලව කටයුතු කළ යුතු වන අතර, එම පුද්ගලයා අදාළ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නැවැත්වීමට අසමත් වන්නේ නම්, එම ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනුයේ සභාවට අයත් ඉඩමක හෝ සභාවට අයත් නොවන ඉඩමක වුව ද, එවැනි ප්‍රචාරක දැන්වීම් එම ස්ථානවලින් වහාම ඉවත්කර දැමීමට අයිතිය හා අධිකාරිය නාගරික කොමසාරිස් සතුවන අතර, ඒ වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් එම පුද්ගලයාගෙන් සභාව විසින් අයකරගනු ලබන අතර, අදාළ පුද්ගලයා එම වියදම් ගෙවීමට බැඳී සිටී.

25. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා යොදාගනු ලබන කිසියම් ලෑලි රාමුවක් අයිතිකරු හෝ එම බදු ගැනුම්කරු විසින් :-

(අ) එම ලෑලි රාමුව සවිකිරීමෙන් පසුව එය පසුකර යන මහජනතාවට එයින් හානියක් නොවී සුරකින බව තහවුරු කිරීම සඳහා එම මනා ලෙස නඩත්තු කළ යුතු වන අතර, එය අවට සිටින ජනතාවට හා එය අවට තිබෙන දේපළවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඉහත කී අයිතිකරු හෝ බදු ගැනුම්කරු වගකිවයුතු වේ ; තවද

(ආ) එම ලෑලි රාමුවේ ඉදිරිපස කොටසේ පැහැදිලිව පෙනෙන ස්ථානයක පැහැදිලි අකුරෙන් කියවිය හැකි වනසේ ඔහුගේ නම, ලිපිනය හා නගර සභා යොමු අංකය ඔහු විසින් ප්‍රදර්ශනය කළ යුතු වේ.

26. වලංගු බලපත්‍රයක් නොමැතිව හෝ අදාළ බලපත්‍රයේ සඳහන් කිසියම් නියමයන් හෝ කොන්දේසිවලට පටහැනිව යම්කිසි නාගරික බලප්‍රදේශයක් තුළ ප්‍රචාරක දැන්වීම් පළ කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරද්දී, පවත්වාගෙන යද්දී නැවතත් ආරම්භ කරද්දී හෝ අවසන් කරද්දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඇති වෙනත් කිසියම් ප්‍රතිකර්මයකට අමතරව එවැනි ව්‍යාපාරයක් ක්‍රියාත්මක කරමින් සිටින හෝ දැනට ක්‍රියාත්මක කර ඇති හෝ ක්‍රියාත්මක කිරීමට සළස්වා ඇති පුද්ගලයාගෙන් ලිඛිත නිවේදනයක් මගින් එම ලිඛිත නිවේදනය කොමසාරිස්වරයා නියම කර ඇති පරිදි එම නිවේදනයේ සඳහන් දිනට දින 07කට නොඅඩු කාලසීමාවකදී එදින හෝ එදිනට පෙර :

(අ) වහා එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන කාර්යය නවත්වා දමන ලෙසටත් ; සහ

(ආ) එම ප්‍රචාරක දැන්වීම් නඩත්තු දමන ලෙසට, ගලවා දැමීමට වෙනස් කිරීමට හෝ මකා දැමීමට,

නාගරික කොමසාරිස්වරයා විසින් ඉල්ලා සිටිය හැකිය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ අනු ඡේද (1) යටතේ යම් පුද්ගලයෙකු වෙත නිවේදනයක් නිකුත් කර ඇති විටෙක, එම නිවේදනයෙන් නිමකර ඇති ඕනෑම නෛතික අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීම අදාළ පුද්ගලයාගේ යුතුකම වේ.

(3) (අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ අනු ඡේද (1) යටතේ නිකුත් කර ඇති නිවේදනය ප්‍රකාර අදාළ නිවේදනයේ නියකර ඇති කාලසීමාව තුළ දී එවැනි කිසියම් ප්‍රචාරක දැන්වීම් ව්‍යාපාරයක් නවත්වා නොදමන විටදී, අදාළ පුද්ගලයා වෙත එම නිවේදනය නිකුත් කළ පසුව එම ප්‍රචාරක දැන්වීම් ඉවත් කිරීම සඳහා නාගරික කොමසාරිස් විසින් කටයුතු කළහැකි අතර, එම පුද්ගලයා අදාළ නිවේදනයට අනුකූලව කටයුතු කිරීමට අසමත් වන්නේ නම්, එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරනුයේ සභාවට අයත් ඉඩමක හෝ සභාවට අයත් නොවන ඉඩමක වුවද එම ප්‍රචාරක දැන්වීම් ඉවත් කිරීමේ අයිතිය හා බලය නාගරික කොමසාරිස් සතුවන අතර, එය ඉවත් කිරීමේදී දරන්නට සිදුවන වියදම් එම පුද්ගලයාගෙන් අයකරගනු ලබන අතර, නාගරික කොමසාරිස් විසින් නිර්ණය කරනු ලබන එම වියදම ගෙවීමට ඔහු හෝ ඇය බැඳී සිටී ;

(ආ) එම ප්‍රචාරක දැන්වීම් කඩාදැමීමට හෝ ඉවත් කිරීම සඳහා කාලය අවශ්‍ය බවට එම පුද්ගලයා ඉල්ලා සිටින්නේ නම්, තමන් විසින් නිර්ණය කරන ලද ඉහත කී වියදම හැර සේවා ගාස්තුවක් පමණක් අයකිරීමට යටත්ව එක් මසක කාලසීමාවක් නොඉක්මවනසේ නාගරික කොමසාරිස් විසින් තමන්හට සුදුසු යැයි හැගෙන කාලසීමාවක් සඳහා නියෝගය ක්‍රියාත්මක වීම කල්දැමිය හැකි වේ.

### සැරසිලි

27. දේශපාලනමය, ආගමික, පුණ්‍යමය, අධ්‍යාපනික හෝ සංස්කෘතික කාර්යයන් සඳහා ඒ කාර්යය වෙනුවෙන් ම නාගරික කොමසාරිස්ගෙන් පූර්වයේදී ලිඛිතව ලබාගත් අනුමැතියකින් තොරව කිසිදු පුද්ගලයෙකු විසින් නගර සභා බලප්‍රදේශය තුළ පිහිටි යම්කිසි වීදියක්, ප්‍රසිද්ධ ස්ථානයක්, පිට්ටනියක් හෝ ක්‍රීඩපිටියක් සැරසීම හෝ සැරසීමට සැළැස්වීම නොකල යුතු ය.

28. එවැනි අනුමැතියක් සඳහා වන සෑම ඉල්ලුම් පතක්ම අවම වශයෙන් අදාළ සැරසිල්ල කරනු ලබන දිනට දින 07කටවත් පෙරාතුව නාගරික කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

කෙසේ වුවද නියමිත කාලසීමාව තුළදී ඉදිරිපත් නොකරන කිසියම් ඉල්ලුම්පතක් වුවද විශේෂ අවස්ථාවන්හිදී නාගරික කොමසාරිස් විසින් භාරගනු ලැබිය හැකිය.

29. සෑම ඉල්ලුම්පතකම පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතු ය.

(අ) අයදුම්කරුගේ නම ;

(ආ) සැරසීමට අදහස් කරන වීදියේ, පාරේ, ක්‍රීඩාපිටියේ හෝ ප්‍රසිද්ධ ස්ථානයේ නම ;

(ඇ) සැරසිල්ලේ ස්වභාවය සහ සැරසිල්ල පවතින කාලසීමාව සහ නාගරික කොමසාරිස් හට අවශ්‍යයැයි සැලකෙන වෙනත් කිසියම් තොරතුරු.

30. ඉල්ලුම්පතක් ලද පසුව, සැරසිලි කිරීම සඳහා යොදා ගන්නා ලද ද්‍රව්‍යයන් ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාදීමට ප්‍රථම සභාවේ තැන්පත් කළ යුතු වන තැන්පත් මුදල කොපමණ ද යන්න නාගරික කොමසාරිස් විසින් තීරණය කළ හැකි වන අතර, නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට අයදුම්කරු විසින් එම මුදල තැන්පත් කළ යුතු වේ.

31. ඉහත සඳහන් සැරසිල්ල සඳහා යොදාගන්නා ලද ද්‍රව්‍යයන්, සැරසිල්ලේ ස්වභාවය ද සැලකිල්ලට ගනිමින් සාධාරණ කාලසීමාවක් තුළ දී එම අයදුම්කරු විසින් ඉවත් කිරීමට අසමත් වුවහොත් හෝ නොසලකා හැරියහොත්, එම සැරසිල්ල ඉවත් කිරීම සඳහා නාගරික කොමසාරිස් විසින් අවශ්‍ය කටයුතු ගතහැකි අතර, ඔහු/ඇය විසින් තැන්පත් කරන ලද තැන්පත් මුදල ඔහුට/ඇයට අහිමිකළ හැකි වේ. එමෙන්ම ඔහු/ඇය හට එම තැන්පත් මුදල නැවත ලබාගැනීම සඳහා හිමිකමක් නොලැබේ.

**පෝස්ටර්ස්**

32. කිසිදු පොස්ටරයක්, ඇලවීමට හෝ ප්‍රදර්ශනය කිරීම සඳහා සභාව විසින් වෙන්කර ඇති ස්ථානවල හැර කොළඹ මහ නගර සභා සීමාව තුළ වෙනත් ස්ථානවල ඇලවීම හෝ ප්‍රදර්ශනය කිරීම කිසිදු පුද්ගලයෙකු නොකළ යුතු වේ.

33. ඉහත විස්තර කරන පොස්ටරයේ අදාල මුද්‍රණකරුගේ සහ/හෝ ප්‍රකාශකයාගේ නම සහ ලිපිනය සඳහන් විය යුතු වේ.

**විවිධ**

34. මෙම අතුරු ව්‍යවස්ථාවලට කිසිවක් පටහැනි වුව ද, සභාවට අයත් හෝ සභාව විසින් නඩත්තු කරනු ලබන දේපළ මත ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩකඩ වෙන් කිරීමට අවශ්‍ය වූ විටදී ටෙන්ඩර් කැඳවීම සඳහා අයිතිය හා බලය නාගරික කොමසාරිස් සතු වේ.

35. නාගරික තක්සේරුකරුගේ අවසන් හා තීරණාත්මක වාර්තාව පදනම් කරගෙන කිසියම් ප්‍රචාරක දැන්වීමක් හෝ දැන්වීම් සඳහා අයදුම්කරුගෙන් අයකරගත යුතු හා අයදුම්කරු විසින් ගෙවිය යුතු වන ගාස්තුව නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලැබේ.

36. මෙම අතුරු ව්‍යවස්ථාවල කිසියම් විධිවිධානයක් කඩකරන්නාවූ ඕනෑම පුද්ගලයෙකු වරදකට වරදකරුවෙකු වන අතර, අදාළ වරදට වරදකරු කරනු ලැබූ පසුව පළමු වරදට රුපියල් දහසක් (රු. 1,000) නොඉක්මවන දඩයකට ද, දෙවනුව හෝ ඉන් අනතුරුව සිදු කරන වරදකට රුපියල් දෙදහස් (රු. 2,000) නොඉක්මවන දඩයකට ද සහ වරදකරු බවට තීරණය කල පසු හෝ එම කඩකිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නාගරික කොමසාරිස් විසින් ලිඛිත නිවේදනයක් බාරදුන් පසුව අදාල කඩකිරීම සිදු කරන සෑම දිනක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන දඩයකට ද යටත් විය යුතු වේ. පෞද්ගලික පරිශ්‍රයක හෝ සභාවට හෝ රජයට අයත් පරිශ්‍රයක හො ඉදිකර ඇති හෝ සවිකර ඇති කිසියම් අනවසර ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරනු ලබන ලෑලි රාමුවක්, සැරසිලි හෝ පෝස්ටර ආදිය ඉවත් කිරීමෙන් වැලැක්වීමට හා අදාළ වගකිවයුතු පුද්ගලයාගෙන් ඒවා ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවන වියදම අයකිරීමෙන් නාගරික කොමසාරිස් වැලැක්වීමට මෙම විධිවිධානයේ අඩංගු කිසිම වගන්තියකින් සිදු නොකළ යුතු වේ.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවන්හි "ප්‍රචාරක දැන්වීම" යන්නට, කිසියම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ ඒ කාර්යයන් සඳහා නිර්මාණය කර ඇති සැකිල්ලක් වැන්නක් සිටුවා හෝ සවිකර ඇති සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් ප්‍රචාරක දැන්වීම් කාර්ය සඳහා වූ ඕනෑම වචනයක්, අක්ෂරයක්, අංකයක්, සලකුණක්, මුද්‍රිත පොස්ටරයක් (placard), පුවරුවක්, නිවේදනයක් යම් කාර්යයක් සඳහා යොදාගන්නා උපකරණයක් (device) අදාර්ශයක් හෝ යම් කිසි මූර්තියක් වැනි දෙයක් ඇතුළත් වේ.

"බැනරය" යන්නෙන්, රෙදිවලින් හෝ පොලිතීන් වලින් සාදා සිරස් අතට ඇද ප්‍රදර්ශනය කරනු ලබන්නක් අදහස් කරයි.

"ත්‍රිකෝණාකාර කොඩි" යන්නෙන්, රෙදිවලින් හෝ පොලිතින් වලින් සාදා සිරස් අතට ඇද ප්‍රදර්ශනය කරනු ලබන්නක් අදහස් කරයි.

"කටවුට්ස් " යන්නෙන්, හතර පැත්තෙන්ම රාමුව බැගින් ඇති කිසියම් දෙයක් ප්‍රදර්ශනය කරන්නක් අදහස් කරයි.

"කොමසාරිස් " යන්නෙන් සභාවේ නාගරික කොමසාරිස්ව අදහස් කෙරේ.

"සභාව" යන්නෙන් කොළඹ මහ නගර සභාව අදහස් කෙරේ.

"ගෘහස්ත නම් තහඩු " යන්නෙන් කිසිදු වෘත්තියක් හෝ ව්‍යාපාරයක් පෙන්නුම් නොකරන හුදෙක්ම පුද්ගලයෙකුගේ නාමය අදහස් කරන්නකි.

"ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරන ලෑලි රාමුව" යන්නෙන් කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා සවිකරන ලද හෝ පාවිච්චි කරනු ලබන කිසියම් නිර්මාණයක, ආධාරකයක්, කණුවක්, පුවරුවක්, තාප්පයක් හෝ වෙනත් උපකරණයක් අදහස් කරයි, සහ

"ගොඩනැගිල්ලක් මත සවිකරන ප්‍රචාරක දැන්වීමක් " යන්නෙන් ප්‍රචාරක දැන්වීම කාර්යය සඳහා යොදා ගනු ලබන කිසියම් වචනයක්, අකුරක්, ආදර්ශයක්, සලකුණක්, උපායක් හෝ මූර්තියක් සහ කිසියම් ඉඩමක ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදිකිරීමක කණුවක, රිටක, වේදිකාවක, රාමුවක් හෝ වෙනත් ආධාරකයක සවිකර ඇති හෝ අමුණා ඇති සහ සම්පූර්ණයෙන් හෝ අඩක් ප්‍රචාරක දැන්වීම් කාර්යය සඳහා යොදා ගනු ලබන කිසියම් වීථියක, පාරක, ඇලක හෝ වැවක යම් ස්ථානයකට දර්ශනය විය හැකි උඩුගුවනට දර්ශනය වන බැලුනයක්, පැරෂුටයක් ට්‍රේලරයක් හෝ ඊට සමාන වෙනත් උපකරණයක් අදහස් කෙරේ.

"සැරසිල්ල" යන්නෙන් රෙදිවලින් කඩදාසිවලින්, පොලිතීන්වලින්, ගස්වලින්, ගහක හෝ ගස්වල කොලවලින් වැල්වලින් සහ මල්වලින් සැදූ කිසියම් සැරසිල්ලක් අදහස් කෙරේ.

"පෝස්ටරය" යන්නෙන් අත්පත්‍රිකාවක්, ලියන ලද හෝ පින්තාරු කරන ලද දැන්වීමක්, පින්තූරයක් හෝ අලවන ලද දැන්වීමක් අදහස් කෙරේ.

අංක 9939 සහ 1949 ජනවාරි මස 21 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1948 වසරේ ප්‍රචාරක දැන්වීම් (කොළඹ මහ නගර සභා) අතුරු ව්‍යවස්ථාව මෙයින් අවලංගු කෙරේ.

07-486

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.